# ඉන්දියා - ශ්‍රී ලංකා පදනම

## පුවත්පත් නිවේදනය

## ඉන්දියා - ශ්‍රී ලංකා පදනමේ 40 වන අධ්‍යක්ෂ මණ්ඩල හමුව කොළඹදී පැවැත්වේ

ඉන්දියා - ශ්‍රී ලංකා පදනමේ (ISLF) 40 වන අධ්‍යක්ෂ මණ්ඩල හමුව 2025 සැප්තැම්බර් 19 වන දින කොළඹදී පැවැත්විණ. මෙම හමුව ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් සන්තෝෂ් ජා මහතාගේ සහ ඉන්දියාවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස් මහිෂිනි කොලොන්නෙ මහත්මියගේ සම සභාපතිත්වයෙන් පැවැත්විණ. පදනමේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් වන තානාපති මෝහන් කුමාර්, අශෝක් මලික්, තානාපති ප්‍රසාද් කාරියවසම් සහ තානාපති ඇසළ වීරකෝන් යන මහත්වරු ද මෙම හමුවට සහභාගි වූහ.

2. අධ්‍යක්ෂ මණ්ඩලය දැනට ක්‍රියාත්මක ව්‍යාපෘතීන්වල ප්‍රගතිය සමාලෝචනය කළ අතර සංස්කෘතික, අධ්‍යාපනික, සෞඛ්‍ය, පාරිසරික, කෘෂිකාර්මික සහ ධාරිතා ගොඩනැගීම ඇතුළු විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරමින් කොළඹ සහ නව දිල්ලි හි පිහිටි ලේකම් කාර්යාල වෙත ලැබී තිබූ නව ව්‍යාපෘති යෝජනා රැසක් අනුමත කළහ. පුස්තකාල විද්‍යාව සහ දෘෂ්‍ය සහ ප්‍රාසාංගික කලා ක්ෂේත්‍රයේ අධ්‍යයන සහයෝගීතාවයන්, දෙරටෙහිම සංස්කෘතික වැඩමුළු සහ සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන්, ශ්‍රී ලංකාවේ පැළවලට වැළඳෙන රෝග වළක්වාලීම සඳහා ක්ෂුද්‍රජීව ඉංජිනේරු පර්යේෂණ, අවදානමට ලක් විය හැකි ප්‍රජාවන් සඳහා පිළිකා සහ ඔසප් සෞඛ්‍ය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්, ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය වෘත්තිකයන් සඳහා ඉන්දියාවේ පුහුණු අවස්ථා, අඩු ආදායම්ලාභී ප්‍රජාවන් සඳහා කාන්තා සවිබලගැන්වීම් සහ උපකාර වැඩසටහන්, ධීවර ක්ෂේත්‍රය ශක්තිමත් කිරීම උදෙසා ධීවර නිලධාරීන් සඳහා ධාරිතා ගොඩනැගීමේ මුලපිරීම්, විද්‍යා සහ පාරිසරික ක්ෂේත්‍රයන්හි දැනුම බෙදා හදා ගැනීමේ වැඩසටහන් සහ වෙරළබඩ ප්‍රදේශවල කඩොලාන සංරක්ෂණ ව්‍යාපෘතීන් වැනි ව්‍යාපෘතීන් රැසක් සඳහා මෙහිදී අනුමැතිය ලබා දෙන ලදී.

3. ඉන්දියා - ශ්‍රී ලංකා පදනම ආර්ථික, විද්‍යා, අධ්‍යාපනික, තාක්ෂණික සහ සංස්කෘතික සහයෝගීතාවය ඉහළ නැංවීම තුළින් ඉන්දු - ශ්‍රී ලංකා සබඳතා ශක්තිමත් කිරීමේ සහ දෙරට ජනතාව අතර අවබෝධය ඉහළ නැංවීමේ අරමුණින් 1998 වසරේ දෙසැම්බර් 28 වන දින ඉන්දියානු සහ ශ්‍රී ලංකා රජයන් අතර අත්සන් තබන ලද අවබෝධතා ගිවිසුමක් මගින් පිහිටුවන ලදී. ඉන්දියා - ශ්‍රී ලංකා පදනම මේ දක්වා ශ්‍රී ලංකා රුපියල් මිලියන 200කට අධික වටිනාකමකින් යුත් ව්‍යාපෘති 600කට වැඩි ගණනකට සහය ලබා දී ඇති අතර ව්‍යාපෘතීන් 360කට අධික සංඛ්‍යාවක් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාවට නංවා ඇත.

***

**කොළඹ**
***2025 සැප්තැම්බර් 20***